# පොළොන්නරු යුගයේ පාලකයන්ගේ ශාසනික කාර්යභාරයන්

## Rulers' Contributions for the development of Sasana in the Polonnaru era

ආර්. එම්. ජී. වසන්ත දිසානායක

**Abstract**

Due to the Chola invasions in 1017 AD, the kingdom of Anuradhapura collapsed and the Rajarata region came under the control of the Cholas and they chose Pulasitipura or Polonnaruwa as the capital of their kingdom. Thus, Polonnaru Kingdom that started in 1215 AD collapsed as a result of the fierce invasion of Magha. During the Polonnaru Kingdom, which existed for nearly two hundred years, many rulers became king, but only a few rulers such as Maha Vijayabahu, Maha Parakramabahu, and Nishankamalla dedicated themselves to the perpetuation of Buddhism. All other rulers devoted most of their reigns to securing their thrones. This article will discuss the works and sacrifices made by the rulers who were in the leadership of the Polonnaru Kingdom for the advancement of Buddhism.

Maha Vijayabahu, Maha Parakramabahu and Nishankamalla are the leading rulers of this kingdom and all three of them restored many religious buildings in different parts of the island which had been destroyed and dilapidated due to foreign invasions, crises between local leaders and various natural conditions. Thus, many new religious buildings have been added in the Buddhist

tradition as well as for the enjoyment of the Sangha. The most important religious activities done by them are re-establishing Higher Ordination of Monks, writing Tripitaka texts, making unity among monks, revision of Sangha and compilation of religious discourses. It can be understood from clear observation that various sacrifice, constructions and renovations made by the rulers mentioned above for the betterment of Buddhism were able to create a great awakening in the Buddhist culture as well as the Buddhist tradition in this country.

**Keywords:** Buddhasasana, Upasampada, Sangasamaggi, Katikavat, constructions

**හැඳින්වීම**

මහාවංසයේ සඳහන් වන විස්තරයන්ට අනුව අනුරාධපුර යුගය අවසන් වන්නේ ක්‍රි.ව. 1017 දී චෝළයන් විසින් පස්වන මිහිඳු රජු ජීවග්‍රහයෙන් අල්වාගෙන, සිරභාරයට ගෙන, අනුරාධපුරය ප්‍රධාන කරගත් රජරට කලාපය යටත් කර ගැනීමෙන් පසුව ය. (උෟ.පූ.ස. මහාවංසො, 1959, පරි. 53. ගාථා. 18,19) පස්වන මිහිඳු රජු පළමු රාජේන්ද්‍ර චෝළ රජුගේ සිරකරුවෙකු බවට පත් වූ පසුව අනුරාධපුර නගරය ඇතුළු රජරට ප්‍රදේශය තම පාලන බලයට නතු කරගත් චෝළයන් 'පුළත්ථිපුර' හෙවත් පුලසිති පුර (පොළොන්නරුව) රක්පාන්කට නම් ස්ථානය ඇසුරු කරමින් රජරට ප්‍රදේශය පාලනය කරන්නට යෙදුණි. (උෟ.පූ.ස. මහාවංසො, 1959, පරි.53. ගා. 22) පොළොන්නරුව කේන්ද්‍ර කරගනිමින් ක්‍රි.ව. 1017 දී චෝළයන් විසින් ආරම්භ කරන පාලන අවධිය ක්‍රි.ව.1215 දී කාලිංග රට මාඝ නම් පාලකයා විසින් සිදු කරන ලද ආක්‍රමණයෙන් අවසන් වේ. ''........ කාලිඟවංශයෙහි උපන් මාඝ නම් වූ එක් අධාර්මික මහීපාලයෙක් තෙම සූවිසි දහසක් යෝධයන්ට අධිපති වූයේ කලිඟුරටින් බැස ලඞකාඞීපය ගත්තේ ය.'' (මහාවංසය, ඞිතීය භාගය, 1996, පරි.80. ගාථා. 54-59) වංසකථාව දක්වන ආකාරයට අනුරාධපුර රාජධානියේ මෙන්ම

පොළොන්නරු රාජධානියේ අවසානය සනිටුවහන් වන්නේ පළමු රාජේන්ද්‍ර චෝළ හා කාලිංග වංශික මාඝ යන රජවරුන්ගේ ආක්‍රමණ නිසාවෙනි.

වසර දෙසීයකට ඉතාම ආසන්න කාලයක් පැවති පොළොන්නරු රාජධානි අවධිය තුළ මහා විජයබාහු, පළමු වික්‍රමබාහු, දෙවන ගජබාහු, මහා පරාක්‍රමබාහු, දෙවන විජයබාහු, නිශ්ශංකමල්ල, වීරබාහු, වික්‍රමබාහු (නිශ්ශංකමල්ල රජුගේ කනිෂ්ඨ සහෝදරයෙක්), චෝඩගංග, ලීලාවතී රැජින (මහාපරාක්‍රමබාහු රජුගේ බිසව), සහස්සමල්ල, කල්‍යාණවතී බිසව (නිශ්ශංකමල්ල රජුගේ බිසව), ධර්මාශෝක නම් බිලිඳු කුමරා, අණීකඞග, ලෝකේශ්වර, පරාක්‍රම පාණ්ඩ්‍ය ආදි වශයෙන් පාලකයන් ගණනාවක් සිංහාසනාරූඪ වූයේ නමුත් බුදුසසුනෙහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරනු ලැබුවේ අතළොස්සක් වූ පාලකයන් කිහිප දෙනෙකු පමණි. මෙහි නම් සඳහන් බොහෝ පාලකයන් හා රැජිනන්ගේ රාජ්‍ය අවධීන් මාස කිහිපයකට හා වසර දෙක තුනකට සීමා වූ බැවිනුත් පැවති දේශපාලන අස්ථාවර බව නිසාත් බුදුසසුනේ අභිවෘද්ධිය කෙරෙහි ඔවුන්ගේ සැලකිල්ල හීන වූ බවක් දැකගත හැකි ය. ඉහත සඳහන් කළ පාලකයන් අතුරෙන් කිහිප දෙනෙකු බුදුසසුනේ චිරස්ථිතය සඳහා විශාල වැඩ කොටසක් සිදු කළ ආකාරයක් දක්නට ලැබෙන අතර එම ශාසනික ක්‍රියාදාමයන් කවරේද යන්න සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් විමසා බැලේ.

## පළමු වන විජයබාහු රජ අවධියට පෙර කාලපරිච්ඡේදයේ ශාසනික තත්ත්වය

අනුරාධපුර රාජධානියේ අවසන් භාගය වන විට අසමගිය අතින් පමණක් නොව විනය ගරුත්වය හා ආචාර සමාචාර අතින්ද භික්ෂු සමාජයේ තත්ත්වය සතුටුදායක වූයේ නැත. ක්‍රි.ව. නව වන සියවසට පමණ අයත් වන අභයගිරි සංස්කෘත ශිලාලේඛනයේ සඳහන්ව ඇති ''අශාසනික වූ දිවිපෙවෙතක් ගතකරන්නවුන් විසින් නොවිසිය යුතු, ස්ත්‍රී පෝෂකයකු විසිනිදු නොවිසිය

යුතු, ලාභ පිණිස හෝ ගෞරව පිණිස බුලත් ආදිය රජගෙට යවන්නහු විසින් ද නොවිසිය යුතු ය.'' ආදි වශයෙන් එන ඇතැම් වගන්තිවලින් (E.Z.Vol.I.1904-1912. p.4,5) මෙන්ම හතර වන මිහිඳු රජුගේ (ක්‍රි.ව.956-972) මිහින්තලා පුවරු ලිපි දෙකෙන් ද (E.Z.Vol.I.1904-1012. pp.84-90) අනුරාධපුර රාජධානියේ අවසන් භාගය වන විට භික්ෂූන් වහන්සේලාගේ විනය ගරුත්වය කවරාකාර වී ද යන්න මැනවින් පැහැදිලි කරගත හැකි ය. ඉහත සඳහන් කළ මූලාශ්‍රය විස්තරයන්ට අනුව කෘෂිකාර්මික කටයුතුවල හා වානිජ කටයුතුවල නියැලී සිටි භික්ෂූන් වහන්සේලා මෙන්ම, ඉඩකඩම් හා වෙනත් දේපළවලට හිමිකම් කියූ ස්ත්‍රී පෝෂණයෙහි නියැලී සිටි භික්ෂූන් වහන්සේලාද සසුන තුළ කටයුතු කරමින් සිටියහ.

වාජිරවාදය නමින් හැඳින්වෙන වජ්‍රයානය මහායානයේ දූෂිත අවස්ථාවක් වන අතර බුදුදහම පැතිරගිය ලෝකයේ සෑම රටකම පාහේ වජ්‍රයානය ද පහසුවෙන් පැතිරවිය හැකි විය. මහායානය ශ්‍රී ලංකාවේ පැවැති කාලයේ වජ්‍රයානය අවුත් ලංකාවේ පැතිරීමෙන් මහායානය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව විය. මෙම පැතිරයාම නිසා ශ්‍රී ලංකාවේ සමාජය තුළ මහායානය මුල්බැස ගැණුනි. මහායාන ආශ්‍රිත තවත් ඉගැන්වීමක් වූ 'රත්නකූට ශාස්ත්‍ර' (ක්‍රි.ව. අටවන සියවස තරම් කාලයේ) ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට උත්සාහ කළ බව පෙනේ. 'නීලපට දර්ශන' නම් වූ තවත් නිකායක් තම ඉගැන්වීම් මෙරට තුළ ප්‍රචාරය කිරීමට උත්සාහ කර තිබේ. (දෙවන සේන රජ දවස) මේ නිකාය අනුගමනය කළ අය බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය වෙනුවට ස්ත්‍රිය, සුරාව හා කාමදේව තුණුරුවන් ලෙස හැඳින්වූහ. ''මේ වෙශය යහපත්දැයි විචාළහ. එකල ඒ තමා ගත් වේශය බොහෝදෙනා දුටුහෙයින් එය ප්‍රශංසා කොට එහි අනුසස් කීය. එතෙපුල් අසා ඔහුගේ වචනකර භික්ෂූහු සිවුරු හැර නිල්පිළි පෙරවියහ. ඉක්බිති එහෙම ''විදගධ වෙශ්‍යාඞගනාවන් හා අනවස්ථිත සුරාපානය හා කාමදෙවයා යන තුන භුවනත්‍රයෙහි අසාධාරණ රත්න''යි තබාගෙන ඊට නමස්කාර කෙරෙමින් සෙසු රත්නයෙහි කදාපහණසේ නිසරුකොට දක්වා ''නීලපටදශීන'' නම් වූ ග්‍රන්ථ රචනාවක් කෙළේය.'' (නිකාය සංග්‍රහය, 1922, පි. 18)

ඉහත පෙන්වාදුන් ආකාරයට සසුන අභ්‍යන්තරය දූෂණයට ලක්ව තිබූ අවස්ථාවක අනුරාධපුර රාජධානියට චෝළ අධිරාජ්‍යයෙන් ආක්‍රමණයක්ද එල්ල විය. එම ආක්‍රමණවලින් භික්ෂු සමාජයට මෙන්ම බෞද්ධාගමික සම්ප්‍රදායේ එන භෞතික සපම්ත්වලටද විශාල හානිදායක තත්ත්වයක් ඇති වූ බව මූලාශ්‍රය විස්තරයන්ගෙන් තහවුරු කරගත හැකි ය. ''(ඒ සොළීහු) තුන් නිකාහි දාගැබ් ද මුළු ලක්දිව් තෙළෙහි මාහැඟි නොයෙක් ස්වර්ණාදි පිළිබිඹුද එසේම ඒ ඒ වෙහෙර සියල්ලද ලාහෙලා බිඳගෙන ඕජස් උරණ යකුන් සෙයින් ලක්දිව්හි සාරය ගත්හ.'' (උ.පූ.ස. මහාවංසො, 1959, පරි.53. ගාථා. 20,21)

ඉහත සඳහන් කළ කරුණුවලින් කියැවෙන්නේ අනුරාධපුර රාජධානියේ අවසන් භාගය වන විට මෙරට සංඝ සමාජය තුළ ඇති වී තිබුණු දූෂිත වූත් පරිහානිමය වූත් තත්ත්වයයි. එම තත්ත්වය චෝළ ආක්‍රමණයේ තීව්‍රතාවය නිසා තවදුරටත් එහි පරිහානිමය තත්ත්වයක් මෙන්ම ව්‍යාකූල බවක් වර්ධනය වී ඇති ආකාරය මහා විජයබාහු රජු රාජත්වයට පත්වන අවධිය වන විට මෙරට සසුන තුළ දක්නට ලැබුණු පරිහානිමය තත්ත්වය තුළින් අවබෝධ කරගත හැකි ය.

## මහා විජයබාහු රජුගේ ශාසනික කාර්යභාරය

වසර පණස් තුනක් පමණ (ක්‍රි.ව.1017 - 1070) රජරට ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන පැවති චෝළ පාලනය අවසන් වන්නේ මහා විජයබාහු රජුගේ රාජප්‍රාප්තියත් සමඟ ය. මහා විජයබාහු රාජත්වයට පත්වූවායින් පසුවා වඩාත් අවධානය යොමු කරවන ලද්දේ ඒ වන විට පරිහානියට පත්ව තිබූ සංඝ සමාජය හා ජරාජීර්ණව පැවති බෞද්ධාගමික සම්ප්‍රදායට අයත් භෞතික සම්පත් (වෙහෙර විහාර ආදිය) නැවත ප්‍රකෘති තත්ත්වයට නැතහොත් ප්‍රතිසංස්කරණය කිරීමට ය. 'විජයබාහු රජ කිරුළ පැළඳීම පවා සිදු කළේ සංඝයා වහන්සේගේ ඉල්ලීම පරිදි බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් ආරක්ෂා කිරීම සඳහා ය.' (E.Z.Vol.II.1912-1927. pp.252,253) යනුවෙන් වේළයික්කාර

සෙල් ලිපියෙහි සඳහන්ව තිබීමෙන් පැහැදිලි වන්නේ බුදුසසුන වෙනුවෙන් මහා විජයබාහු රජුගේ දායකත්වය කෙබඳු වූවක්ද යන්නයි.

මහා විජයබාහු රජුගෙන් බුදුසසුනට සිදු වූ වැදගත්ම සේවය වනුයේ බුරුම රාජ්‍යයේ (රාමඤ්ඤ රට) සමකාලීන පාලකයා වූ අනෞරථ හෙවත් අනුරුද්ධ රජුගේ සහයෝගය ඇතිව මෙරට තුළ නැවතත් උපසම්පදාව පිහිටුවීමේ ක්‍රියාවලිය යි. ඉහත සඳහන් කළ ආකාරයට දේශපාලනික විචල්‍යතාවන් හමුවේ මෙන්ම විවිධ දූෂිත හැසිරීම් රටාවන් නිසා ඛේදනීය ඉරණමකට මුහුණ පා සිටි මෙරට භික්ෂු සමාජය ඇසුරෙන් උපසම්පදා විනය කර්මය සිදුකිරීමට අවශ්‍ය කරන ගණපූරක සංඛ්‍යාවක් හෝ සොයා ගැනීමට නොහැකි වීමෙන් පැහැදිලි වනුයේ තත් සමාජයේ පරිහානිමය තත්ත්වය කෙබඳු තත්ත්වයක පැවතියේද යන්නයි. ''උපසම්පදා කර්මයට ගණපූරක භික්ෂූන් නොපොහොනා බැවින් බුදු සසුන් පැවැත්මෙහි කැමති සිත් ඇත්තේ ඉක්බිත්තෙන් රාමඤ්ඤ රට අනුරුද්ධ නම් මිතුරු රජු වෙත පඬුරු සහිත වූ දූතයන් යවා ඒ රටින් තුන්පිටකයෙහි පරතෙරට ගියාවූ ශීලාදී ගුණයන්ට ආවාසු වූ ස්ථවිර සම්මත වූ භික්ෂූන් ගෙන්වා ඒ රජ තෙමේ උන්වහන්සේලා උදාර වූ පූජායෙන් පුදා නොයෙක් පරිද්දෙන් පැවිදි උපසම්පදා කරවා බොහෝ සේම අටුවා සහිත තුන්පිටකය ද කියවා ලක්දිව පසුබස්නාවූ බුදුසස්න බැබලවී.'' (මහාවංසය, ඕිතිය භාගය, 1996, පරි.60. ගාථා 5 - 8) ''ගණපූරකයට යටත්පිරිසෙයින් සිල්වත් සඟ පස්නමක් පමණ නොලදින් කලකිරුණාවූ සිත් ඇතිවැ ලක්ෂ ගණන් මුතු මැණික් දෙශාන්තරයට යවා අරමණරට වැසි ස්ථවිර පදප්‍රාප්ත සිල්වත් සඟ විසිනමක් හා පත් පොත් ගෙන්වාගෙන මළුකම් කරවා ලක්දිව නොයෙක් දහස්ගණණ් මහාසඞසයා ඇති කරවා ශාසනය වර්ධනය කරවූහ.'' (නිකාය සංග්‍රහය, 1922, පි. 19) ''තුන් පිටකය ලියවා බික්සඟනට දින'' (මහාවංසය, ඕිතිය භාගය, 1996, පරි. 60. ගා. 22) ආදි වශයෙන් මහා විජයබාහු රජු විසින් එකල සසුනෙහි ඇතිව තිබූ තත්ත්වය සමනය කරමින් සසුනෙහි චිරස්ථිතය සඳහා උපසම්පදාව පිහිටුවා, භික්ෂු සංඝයා වර්ධනය කොට, ත්‍රිපිටකය ඉගෙන ගැනීම සඳහා අවස්ථාව සලසා දුන් බව

මූලාශ්‍රයේ සඳහන්ව තිබේ. ත්‍රිපිටකය ලියවා එය භික්ෂු සංඝයාට පරිහරණය කිරීම සඳහා අවස්ථාව සලසා දුන් රජතුමා 'අත්ථසාලිනී නම් ධම්මසංගණීප්‍රකරණට්ඨකථාව' සිංහල භාෂාවට පරිවර්තනය කරමින් ත්‍රිපිටක සාහිත්‍යයේ ප්‍රවර්ධනයට ද දායකත්වය සපයා තිබේ. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 60. ගා. 18)

මහා විජයබාහු රජු අතින් සිදු වූ ශාසනික ක්‍රියාදාමයන් අතුරින් තවත් වැදගත් කර්තව්‍යයක් වනුයේ දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා දළදා මන්දිරයක් ඉදි කරවීමයි. පොළොන්නරුවේ වේළයික්කාර සෙල් ලිපියෙහි දැක්වෙන ආකාරයට එතෙක් උත්තර මූලායතනයෙහි තැන්පත් කර තිබූ බුදුන්වහන්සේගේ දන්ත ධාතුන් වහන්සේ හා පාත්‍රා ධාතුන්වහන්සේට ස්ථිර ආරක්ෂා ස්ථානයක් වශයෙන් පොළොන්නරුවෙහි දළදා මන්දිරයක් ඉදිකොට එහි ආරක්ෂාව මුගලන් මහාස්ථවිරයන් වහන්සේගේ ඉල්ලීම පරිදි වේළයික්කාර හමුදාවට බාර දී තිබේ. (E.Z.Vol.II.1912-1927. p.252) ''හෙතෙම මහාර්ග වූ මනරම් දළදා මැදුරක් කරවා දළදාවහන්සේට සතතයෙන් මහපුද කරවී.'' (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 60. ගා. 16) යන මූලාශ්‍රය විස්තරයන්ගෙන් දළදා වහන්සේ වෙනුවෙන් මහා විජයබාහු රජු ඉදි කළ දළදා මාලිගය පිළිබඳව තොරතුරු තහවුරු කරගත හැකි ය.

මහා විජයබාහු රජු විසින් නව ආගමික ගොඩනැගිලි නිර්මාණ රැසකුත් පැරණි ආගමික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ රැසකුත් සිදු කළ බව මූලාශ්‍රය තුළ සඳහන්ව ඇත. ''පුලස්ති පුරය තුළ පියසෙහි ඒ ඒ තන්හී අතිශයින් මනහර වූ බොහෝ විහාරයන් කරවා තුන් නිකාවැසි වූ සමණන් එහි වාසය කරවා උදාර වූ සිව්පසයෙන්ද සැතප්වී. ඉන්ද්‍රඛීලස්තම්භයෙන් මනහර වූ පවුරු අගලින් යුක්ත වූ පස්මහල් මහපයකින් බබලන්නා වූ හාත්පස යහපත් වූ ආවාසපෙළින් මොනවට බබලන්නා වූ මිනිසුන්ගෙන් ගැවසුනා වූ අවකාස ඇති බබලන බිහිදොර ඇත්තා වූ උතුම් වෙහෙරක් රත්නත්‍රය පිහිට කොට ඇති ඒ රජතෙම කරවා තුන්නිකාවාසි වූ භික්සඝනට දින. හෙතෙම සංඝයාට පිස දියයුතු දන් වැටුප් පිණිස එහි වාසීවූ ප්‍රධානීන් සමඟ ඇළිසර

නම් රට දී, එහි සමණන් නොයෙක් සිය ගණන් වස්වා හෙතෙම සතතයෙන් උදාරවූ සිව්පස පැවැත්වී.'' (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 60. ගාථා. 9-15) මහාවංසයේ එන මෙම විස්තරයට අනුව පුලස්තිපුර නගරය තුළ ඉතා මනහර වූ විහාරයක් කරවා තුන් නිකාය වැසි භික්ෂු සංඝයාට එය පූජා කොට උන්වහන්සේලා වෙනුවෙන් සිව්පසයද පිරිනමා තිබේ. ඊට අමතරව නගරයට ආසන්න ප්‍රදේශයක පස්මහලින් යුත් ආවාස පෙළක් කරවා තුන් නිකායවාසී භික්ෂු සංඝයාට පූජා කොට තිබේ. එයින් නොනැවතුනු විජයබාහු රජු එහි වාසය කළ සිය ගණනක් වූ භික්ෂු සංඝයාට දන් පිළිගැන්වීම සඳහා ඇළිසර (ඇළහැර) රටින් ලැබෙන ආදයම් සමඟ එහි ජනප්‍රධානීන්ද (භික්ෂු සංඝයාට ආවතේව කිරීම සඳහා) දී තිබේ. මූලාශ්‍රය විස්තරයන්ට අනුව අනුරාධපුර අවධියේ සිට පැවත ආ මහාවිහාර, අභයගිරි හා ජේතවන යන තුන් නිකා වැසි භික්ෂු සමූහයා මෙම අවධිය තුළ ද එයාකාරයෙන් ම පෙනී සිටි බව මෙයින් පැහැදිලි වේ.

මාගම තුන්නිකාහි සොළීන් විසින් නසන ලද්දා වූ දාගැබ්ද, ථූපාරාම දෙකෙහි දැගැබ්ද නැවත බැන්ද වී. සිය මෑණියන් හා පියාණන්ගේ සොහොන් බිම්හී ද මහත් ආවාස පසක් කරවූයේ ය. බුදලවිට්යෙහිද එයාකාරම වූ ආවාස පසක් ඉදි කළේ ය. පාඨීනවෙහෙරද, රක්සැපව් නම් වෙහෙරද, එසේම මඬලගිරියද, මීගොඩ වෙහෙරද, උෟරුවෙල් නම් වෙහෙරද, දෙවිනුවර වෙහෙරද, මියුගුණ වෙහෙරද, සිහිල්ගම් ලෙනද, දඹකොළ වෙහෙරද, එසේම ගිරිකඩ වෙහෙරද, කුරුන්දි වෙහෙරද, දඹකොළ ලෙනද, බදුළු වෙහෙරද, පරගම් වෙහෙරද, කසගල් නම් වෙහෙරද, සඳගිරි වෙහෙරද, වෙල්ගැමි වෙහෙරද, මහසෙන් නම් ගම වෙහෙරද, එසේම අනුරාධපුරයේ බෝගෙයද, යනාදි වශයෙන් හැඳින්වෙන ඔහුගේ රාජප්‍රාප්තිය සිදු වන අවස්ථාව වන විට ජරා ජීර්ණව පැවති වෙහෙර විහාර ඔහු විසින් ප්‍රතිසංස්කරණය කොට ඒවාහි නඩත්තුව සඳහා ගම් ද වෙන් වෙන් වශයෙන් දුන් බව වංසකථාවේ සඳහන්ව ඇත. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි.60. ගාථා. 56-63)

ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීමට යාම මේ අවධිය වන විට ජනප්‍රිය වන්දනා ගමනක්ව පැවති බව තහවුරු වනුයේ ඒ සඳහා යන ගමන් මාර්ග මහා විජයබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කොට එහි නඩත්තු කටයුතු සඳහා විවිධාකාරයෙන් ගම්බිම් පූජා කළ බවට පළවන වාර්ථාවන්ගෙනි. ''සමන්කුළුපව්වෙහි පිහිටි මුනිරජහුගේ පාසටහන වන්දනා පිණිස දුකසේ යායුතු මග යන්නා වූ මනුෂ්‍යයෝ සියල්ලෝම නොපෙළෙත්වා''යි දන් වැටුප් පිණිස හැල්කෙත් ආදියෙන් සමෘද්ධිමත් වූ ගිලීමලය නම් ගම දෙවී. (ගිලීමලය ග්‍රාමය රත්නපුර දිස්ත්‍රිකයේ පිහිටි එකකි) කෙසෙල්ගම් මගද එසේම උෟවරට මගද වෙන් වශයෙන් ගම් දී සාලාද කරවී.'' (මහාවංසය, ළිතිය භාගය, 1996, පරි. 60. ගාථා. 64-66) සමන්තකූඨ පර්වතයට මාර්ග තුනක් ඔස්සේ එකල ජනයා වන්දනාවේ ගිය බවත් එම මාර්ග තුන ම ප්‍රතිසංස්කරණය කරමින් එහි නඩත්තුවට මෙන්ම වන්දනාවේ පැමිණෙන අයගේ පහසුකම් සැලසීම සඳහා වෙන වෙන ම ගම් පූජා කළ බව වංසකථාවේ සඳහන්ව ඇත. මෙවැනි සත්කාර්යයක් මහා විජයබාහු රජු විසින් සිදු කළ බව ඔහුගේ අඹගමුව ශිලා ලේඛනයේද සඳහන්ව ඇත. ''සමනොළකුළෙහි කම්නවාම් පුද ...... මහසඟුන්වහන්සේට වඩනා පිඬු පසයට හා සෙසු දා වන්දනයට රුස්වන ආගත (දුබ්බා)ගතයනට ..... පස් ගවුයෙහි අප නැමින් ගවුයෙකැ දන්හලක් කරවා ..... අඹගමුව (වැල)ගම්(පො)ළ උලපනා ඇතුළුවැ .....'' (E.Z.Vol.II. 1912-1927. pp. 211"212) 'රජතෙමේ අනාගත කාලයෙහි රජදරුවෝ ඒ ගම් නොගණින්වයි අකුරු කොටවා ගල්ටැම්ද පිහිටවී.'' (මහාවංසය, ළිතිය භාගය, 1996, පරි. 60. ගාථා. 67,68)

ඉහත සඳහන් කළ ආකාරයේ නව ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් හා විවිධ වෙහෙර විහාරස්ථානලට ගම් බිම් පූජා කිරීම්වලට අමතරව විවිධ භික්ෂු කණ්ඩායම් වෙනුවෙන් විවිධාකාර වූ පූජාවන් මහා විජයබාහු රජු විසින් සිදු කළ බව වංසකථාවේ සඳහන්ව ඇත. ''ඒ රජතෙමේ ලාභස්ථානවාසිවූ සමණන්ට අකුරුවිට නම් ගමද, එසේම සඟුළුගමද, සිරිමඬගල් ගමද දුන්නේ ය. වතින් ජීවත්වන සමණන්ට හෙතෙම සිවුපස

දින. ඒ තෙමේ ඒ සමණන්ගේ නෑයන්ටද භෝග උපදනා ගම් දෙවි. ශීත ඍතුවෙහි පොරෝණයන්ද, ගිනිකබල්ද, නානා ඔසුද බොහෝ සේම බික්සඟනට දුන්නේ ය. නුවණැත්තා වූ හෙතෙම නොයෙක් වර සියලු පිරිකරද අටපිරිකරද සකස් කොට බික්සඟනට දින. ලාභස්ථානවාසී භික්ෂුසංඝයාගේ පිසුම් වැටුප් පිණිසද සෑ ආදිය පුදන පිණිස වතාවත්කරුවන්ටද පෙර රජදරුවන් විසින් දෙන ලද යම් ගම් කෙනෙකේ රුහුණ වූ නම් අඩුනොවූ ඒ සියල්ලද හෙතෙම පෙර පරිද්දෙන් තැබ්බවී.'' (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 60. ගාථා. 68-73) යන මූලාශ්‍රය විස්තරයෙන් ඔහු විසින් භික්ෂු සංඝයා වෙනුවෙන් කරන ලද පරිත්‍යාගයන් කවරේද යන්න පැහැදිලි කරගත හැකි ය.

බුදුසසුනේ චිරස්ථිතිය සම්බන්ධයෙන් සුවිශාල වැඩකොටසක් සිදු කළ මහා විජයබාහු රජතුමා ධර්ම දේශනා කෙරෙහි ඇළුණු සිත් ඇත්තේ ධර්ම දේශකයන් වහන්සේලාට නොයෙක් ආකාරයෙන් පූජා පවත්වමින් ධර්ම දේශනා පැවැත්වී ය. තෙවරක් බැගෑපතුන්ට තුලාභාර ද දෙවී ය. බෞද්ධාගමික පරිසරයක ජීවත් වූ එතුමා පෙහෙවස්ද සමාදන් විය. මීට අමතරව එතුමා අවුරුදු පතා දඬිස්සර නම් දානයක් ද දුන් බව වංසකථාවේ සඳහන්ව ඇත. නොයෙක් රන් මුතු මැණික් ආදි වටිනා සම්පත් යවමින් දඹදිව මහාබෝධියට නොයෙක් වර පූජාවට ලක් කළේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි.60. ගාථා. 20-23)

මහා විජයබාහු රජතුමා බුදුසසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් විවිධාකාර වූ නව නිර්මාණයන්, ප්‍රතිසංස්කරණයන් හා ග්‍රන්ථ සම්පාදනයන්, භික්ෂු සංඝයා වෙනුවෙන් කරන ලද පුද පූජාවන් හා පරිත්‍යාගයන්ට අමතරව ඔහුගේ පවුලේ සාමාජිකයන්ද බුදුසසුනේ චිරස්ථිතිය සඳහා විවිධ නිර්මාණ හා පරිත්‍යාගයන් සිදු කළ බව වංසකථාවේ සඳහන්ව ඇත. ''රජහු දූවූ යසෝධරා තොමෝ කපුරු මුල් නම් වෙහෙර තහවුරු සිත්කළු මහ පිළිමගෙයක් කරවී. රජහූ සියරැජින තොමෝ ගලතුරුසුමුවෙහි ප්‍රසාද එලවන්නා වූ උත්තුඟ වූ මහපහයක් කරවී.'' (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි.60. ගාථා. 83-85)

මේ ආදි වශයෙන් වංසකථා සාහිත්‍යය හා අභිලේඛන මූලාශ්‍රයේ සඳහන් වන විස්තරයන්ගෙන් මහා විජයබාහු රජතුමා බුදුසසුනේ චිරස්ථිතිය කෙරෙහි දැක් වූ දායකත්වයත්, බෞද්ධයෙකු ලෙසින් බෞද්ධාගමික පරිසරයක ජීවත් වූ ආකාරයත් පැහැදිලි කරගත හැකි ය. ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් මහා විජයබාහු රජුගේ ක්‍රියාකලාපය වඩාත් වැදගත් වන්නේ ඒ වන විට සසුන තුළ ඇති වී තිබූ තත්ත්වයන් සමනය කිරීම සඳහා ගන්නා ලද පියවරයන් වඩාත් වැදගත් වන බැවිනි. අරමණ දේශයේ අනුරුද්ධ රජුගේ සහය ඇතිව නැවතත් ථෙරවාදී උපසම්පදාව පිහිටුවීම, ත්‍රිපිටකයට අදාළ ග්‍රන්ථ නැවත වතාවක් ලියවා තැබීම, භික්ෂූන් වහන්සේලාට ත්‍රිපිටකය හැදෑරීමට අවස්ථාව සලසාදීම, දළදා වහන්සේ වෙනුවෙන් නව දළදා මන්දිරයක් ඉදිකිරීම, අගනගරය තුළ හා ඊට වඩාත් ආසන්නයේ තුන්නිකාය නියෝජනය කරන භික්ෂු කණ්ඩායම්වලට නව වාසස්ථාන ඉදිකරදීම, චෝළ පාලනය නිසා මෙන්ම විවිධ තත්ත්වයන් හමුවේ ජරාජීර්ණත්වයට හා විනාශයන්ට පත් වූ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ස්ථානගතව තිබූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම වැනි වැදගත් කාර්යයන් රැසක් මහා විජයබාහු රජු අතින් සිදුවිය.

## මහා පරාක්‍රමබාහු රජ අවධිය තෙක් වූ කාලය තුළ ශාසනික තත්ත්වය

මහා විජයබාහු රජුගේ මරණින් පසුව රාජකීය පවුලේ ඇති වූ දේශපාලන අර්බුදකාරී තත්ත්වය නිසා ශ්‍රී ලාංකේය රාජ්‍යය රජරට, දක්ඛිණ දේශය හා රුහුණ වශයෙක් කොටස් කිහිපයකට බෙදී ගොස් තිබුණි. රජරට පළමු වැනි වික්‍රමබාහු යටතේත්, දක්ඛිණ දේශය මානාභරණ යටතේත් රුහුණ කීර්ති සිරි මේඝ හා සිරිවල්ලභ යටතේත් පැවැතුණි. මහා විජයබාහු රජුගේ අභාවයෙන් පසුව උපරාජ තනතුර හිමිවිය යුතුව තිබුණේ ඔහු පුත් වික්‍රමබාහු කුමාරයාට ය. සම්ප්‍රදාය හා නීතිය එසේ වුව මහරජුගේ නැගණිය වූ මිත්තා හා ඇයගේ පුතුන් තිදෙනාද මහ ඇමැතිවරුද, අෂ්ට විහාරවාසී වූ භික්ෂූහුද උපරාජයා වශයෙන් පත්කළේ මිත්තාගේ වැඩිමහල් පුත් මානාභරණයන් ය.

(මහාවංසය, ද්විතිය භාගය, 1996, පරි. 61. ගාථා. 1-4) රාජකීය පවුල අතර සිවිල් යුද්ධය ආරම්භ වන්නේ මෙතැන් සිට ය. රාජත්වය අනුප්‍රාප්තියේදී අෂ්ට මූල විහාරීය භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරන ලද මැදිහත්වීම නිසා එම භික්ෂු සංඝයා සමඟ අමනාප වූ වික්‍රමබාහු තෙමේ වෙහෙර විහාර විනාශ කිරීමටත් භික්ෂූන් වහන්සේලාට හිරිහැර කිමරීටත් පටන් ගත්තේ ය. ''ඒ වික්‍රමබාහු රජතෙමේ බුද්ධාදීන් සන්තක භෝග ගම් උදුරා සේවකයන්ට දින. හේතෙමේම පොළොන්නරුවෙහි ධාතුයෙන් අලංකෘත වූ නොයෙක් විහාරයන් පරදෙසිකවූ යෝධයන්ට වසන පිණිස දින. සැදැහැත්තන් විසින් පාත්‍රධාතුවටද, උතුම් දළදාවටද පුදන පිණිස දෙන ලද මිණිමුතු ආදියද සඳුන් අගිල් කපුරුද රන් ආදියෙන් නිමවන ලද්දාවූ පිළිමයන්ද පැහැරගෙණ කැමිතිසේ විනාශයට පත් කළේ ය. සස්නටද ලොවටද කරනු ලබන්නා වූ උවදුරු බොහෝසේ බලමින් එකල්හී උහු කෙරෙහි කලකිරුණු සිත් ඇත්තාවූ අෂ්ටමූල විහාරයන්හී ගරුවසයෙන් සම්මත වූ භික්ෂූහුද දෙකොටසට ඇතුළත් වූ පාංශුකූලික භික්ෂූහුද ''මෙසේ තීර්ථකයන් සමවූ සස්නට බොහෝ උවදුරු කරන්නවුන් හමුවෙන් බැහැරයාම උතුමැ''යි සිතා උතුම් දළදාව හා පාත්‍රා ධාතුව ගෙණ රුහුණට ගොස් පාසුවූ ඒ ඒ තන්හී වාසය කළහ.'' (මහාවංසය, ළිතිය භාගය, 1996, පරි. 61. ගාථා. 54-61) මහාවංසයේ එන මෙම සඳහනින් වික්‍රමබාහු සසුන විනාශ කිරීම සඳහා කරන ලද ක්‍රියාමාර්ගයන් කවරේද යන්න හඳුනාගත හැකි ය. එක් අතකින් මෙම විනාශයට අෂ්ටමූල විහාරයන්හි භික්ෂූන් වහන්සේලාද වගකිව යුතු ය. වික්‍රමබාහු මේ ආකාරයෙන් ක්‍රියා කිරීමට පෙළඹූයේ තම උපරාජ තනතුර සම්ප්‍රදාය උල්ලංඝනය කරමින් මානාභරණට දුන් නිසාවෙනි. සිදු නොකළ යුතු එම කාර්යයට භික්ෂූන් වහන්සේලාද මැදිහත් වූ බැවින් අවසානයේ මෙවැනි අවාසනාකාරී තත්ත්වයකට මුහුණ පාන්නට සිදු විය. මෙම දේශපාලන වියවුල්කාරී පරිසරය තුළ භික්ෂු සමාජය තුළ ද අතිශය පරිහානිමය තත්ත්වයක් උදා වී තිබුණු බව වංසකථාවේ එන සඳහනකින් තහවුරු කරගත හැකි ය. ''සඟසතුගම්හි සංඝයාගේ පුත්‍රදාරාදී පෝෂණය ම ස්වභාවය එයින් අන්‍යවූ ශීලයක් නැත්තේම ය.'' යනුද සමගිවූ කර්මාදිය තබා ඔවුනොවුන් දර්ශනයත් නොරුස්නා .....'' (මහාවංසය, ළිතිය

භාගය, 1996, පරි. 71. ගාථා. 3,4) යනාදි වශයෙන් එන සඳහනින් අභ්‍යන්තර අර්බුද පැවති කාලපරිච්ඡේදය තුළ භික්ෂු සංඝයා වෙතින් පිළිබිඹු වූ තත්ත්වයත් ඔවුන්ගේ හැසිරීම් රටාවත් කෙබඳු වූවක්ද යන්න පැහැදිලි ය.

**මහා පරාක්‍රමබාහු රජුගේ ශාසනික කාර්යභාරය**

ඉහත සඳහන් කළ ආකාරයට දේශපාලනික ක්ෂේත්‍රයේ මෙන්ම සංඝ සමාජයේ ද පරිහානිමය තත්ත්වයක් පිළිබිඹු වූ කාලපරිච්ඡේදයක මහා පරාක්‍රමබාහු කුමරුගේ රාජප්‍රාප්තිය සිදු විය. ශ්‍රී ලාංකේය රාජ්‍යය තුළ සිංහාසනප්‍රාප්ත පාලකයන් අතුරින් ශාසනික අභිවෘද්ධිය සඳහා සිය දායකත්වය සැපයූ පාලකයන් අතුරින් ඉදිරියෙන් ම සිටින පාලකයෙක් ලෙස මහා පරාක්‍රමබාහු රජතුමා හඳුනාගත හැකි ය. ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එතුමා කළ කාර්යයන් අතුරින් වැදගත් ම ක්‍රියාදාමයන් වූයේ සංඝ සංශෝධනය හා නිකාය සාමග්‍රිය මෙන්ම ශාසනික කතිකාවතක් සිදුකිරීමට අවශ්‍ය කරන රාජ්‍ය අනුග්‍රහය ලබාදීමයි.

'බුද්ධශාසනාභිවෘද්ධිය කරනු කැමැත්තේ ''සඟසතුගම්හි සංඝයාගේ පුත්‍රදාරාදි පෝෂණය ම ස්වභාවය එයින් අන්‍යවූ ශීලයක් නැත්තේම ය.'' යනුද සමගිවූ කර්මාදිය තබා ඔවුනොවුන් දර්ශනයත් නොරුස්නා සුසිල්වත් කිසියම් භික්ෂූන්ද බලා බුද්ධ ශාසනාභිවෘද්ධිය පිණිස පළමු කොට ශාසනශුද්ධියද තුන්නිකා වැසි භික්ෂූන්ගේ සාමග්‍රියද කරවනු කැමැත්තේ ධර්මාශෝක මහරජහු මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් (ප්‍රධානකොට) සෙයින් ත්‍රිපිටකධර විශාරද වූ විශේෂයෙන් විනය දන්නාවූ ස්ථවිරවංසයට අසහාය ප්‍රදීපායමානවූ පැවිදිව බොහෝකල් ඇත්තාවූ මහාකශ්‍යප නම් මහාස්ථවිරයන් ප්‍රධාන කොට අනුරාධපුරවාසී වූ ශිෂ්‍යයන් සහිත ඤාණපාල නම් ස්ථවිරයන්ද, සපරගමු වැසි භික්ෂූන්ද, මෞද්ගලල්‍යායන ස්ථවිරයන් සහිතවූ නාගෙන්ද්‍ර පල්ලියෙහි ස්ථවිරයන්ද, යුවරජ, රටවැසි අන්‍යවූ සියලු භික්ෂූන්ද, ගලතුරුමුල විහාරවාසීවූ ස්ථවිරොත්තමයන් ප්‍රමුඛකොට රුහුණුරට තුන්නිකා වාසි භික්ෂූන්ද පොළොන්නරුවට කැඳවූයේ ය.'' (මහාවංසය,

ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 3-10) වංසකථාවේ සඳහන්ව ඇති ආකාරයට සංඝ සමාජයේ දිස්වූ පරිහානිකර තත්ත්වය නිරීක්ෂණය කළ රජතුමා සසුනේ පාරිශුද්ධිබවත් තුන්නිකායේ සංඝ සාමග්‍රියත් අපේක්ෂාවෙන් ධර්මාශෝක රජතුමා අනුගමනය කළ ක්‍රමවේදය ම අනුගමනය කරමින් එම කාර්යයන් කිරීමට සුදුසු භික්ෂූන් වහන්සේලා සියලු දෙනා පොළොන්නරුවට කැඳ වූ බව මෙහි සඳහන් වේ.

ඉහත සඳහන් කළ ආකාරයට රජතුමා සියලු භික්ෂූන් වහන්සේලා කැඳවා මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලාගෙන් සමගි වන මෙන් ආයාචනා කර සිටියේ ය. අලජ්ජී භික්ෂූන්ගේ වැඩිවීමත් බොහෝ කලක් සසුන තුළ ඇතිව තිබූ භේද භින්නතා නිසාත් බොහෝ භික්ෂූන් වහන්සේලා සමගිවීමට කැමැත්තක් දැක්වූයේ නැත. ඇතැම් කෙනෙක් පරදේශයට යැමටද ඇතැම් කෙනෙක් සිවුරු හැර යාමටද පටන් ගත්හ. ඇතැම් කෙනෙක් විනිශ්චය මණ්ඩලයෙහි සිටීමටද කැමැත්තක් දැක්වූයේ නැත. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 11-13) මෙවැනි පරිසරයක් තුළ මහාකාශ්‍යප හිමියන් ප්‍රමුඛ භික්ෂූන් ලවා මහාධිකරණ විනිශ්චය සිදුකරමින් තමන්ද ඉතා සමීපව එය නිරීක්ෂණය කරමින් මහාවිහාරවාසී වූ සියලු භික්ෂූන් වහන්සේලා සමගි කළේ ය. මෙම ක්‍රියාවලියේදී දුස්සීලයන් ''ලාභාපෙක්ෂාවෙන් ශාසනය නොනසත්ව'' යි මහතනතුරුදී සිවුරු හැරවූයේ ය. මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා සමගි කිරීමෙන් පසුව වට්ටගාමණී රජ අවධියේ පටන් වර්ගභාවයට ගිය අභයගිරිවාසි භික්ෂූන්ද මහසෙන් රජ අවධියේ පටන් වෛතුල්‍යවාදී අබුද්ධ වචනය ම බුද්ධ වචනයැයි ප්‍රකාර කරන්නාවූ ජේතවනවාසී භික්ෂූන් වහන්සේලා මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා සමග සමගි කිරීමට කටයුතු ආරම්භ කළේ ය. නමුත් එම භික්ෂූන් එයට එකඟතාවක් දැක්වූයේ නැත. එයින් පසුබට නොවූ රජතුමා විවිධ ක්‍රම දන්නවුන් ලවා විචාරණ ලද්දේ එකම උපසපන් භික්ෂුවක් හෝ ඔවුන් අතුරෙන් හඳුනාගැනීමට අපොහොසත් විය. එමනිසා බොහෝ භික්ෂූන් සාමණේර බවට පතකළේ ය. දුස්සීල භික්ෂූන් සිවුරු හරවා මහ තනතුරු දුන්නේ ය. මේ ආකාරයෙන් රජතුමා

මහත් වූ උත්සාහයෙන් සසුන පිරිසිදු කොට සාමග්‍රිය ඇති කොට බුද්ධ කාලයේ මෙන් නැවත ස්ථාපිත කළේ ය. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 78. ගාථා. 16-28) මෙම ක්‍රියාවලියෙන් පසුව රජතුමා සියලු භික්ෂූන් වහන්සේලා මහවැලි ගඟෙහි කරවන ලද සීමාවකදී වසරක් පාසා උපසම්පදා විනය කර්මය කරවමින් භික්ෂූන් වහන්සේලාට මාහැඟි සිවුරුද නොයෙක් පිරිකරද දුන් බව වංසකථාවේ සඳහන්ව ඇත. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 78. ගාථා. 28-31)

මහා පරාක්‍රමබාහු රජුගේ දායකත්වයෙන් උදුම්බරගිරිවාසී කාශ්‍යප හිමියන්ගේ මූලිකත්වයෙන් සිදු කළ සංඝ සංශෝධනය, ශාසනික කතිකාවත හා තුන්නිකා සාමග්‍රිය පිළිබඳව වංසකථාවේ දැක්වෙන විස්තරයට සමගාමී වූ විස්තරයක් පොළොන්නරුවේ ගල්විහාර ශිලාලේඛනයේද ඇතුළත්ව ඇත. ''වළගම් අභා මහරජු දවසැ පටන් එක්වාදහස් දෙසිය සූ පනැස් හවුරුද්දක් භින්න නිකායවැ ශාසනය පිරි(යෙ)මින් සිටි කල්හි ...... උදුම්බරගිරි නිවාසි මාහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහාවිහාරාධිවාසි භික්ෂු දැකැ......''(E.Z.Vol.II.1912-1927.p.263) යනුවෙන් ශිලාලේඛනයේ එන සඳහනින් මෙම සංඝ සංශෝධනය වළගම්බා රජ දවසින් පසුව නිශ්චිතව සිදුවූයේ කෙදිනද යන්න පැහැදිලි කරගත හැකි ය. එසේම මේ සඳහා නායකත්වය ගත් භික්ෂූන් වහන්සේ මෙන් ම එයට අනුකූලතාවය දැක් වූ භික්ෂු කණ්ඩායම කවුරුන්ද යන්නද හඳුනාගත හැකි ය. මහාපරාක්‍රමබාහු රජතුමා මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් අශෝක අධිරාජයා තෙවන ධර්ම සංගායනාව සිදු කළ ආකාරයෙන් තමන්ද මේ කාර්යය සිදු කළ බව ශිලාලේඛනයේ සඳහන්ව ඇත. (E.Z.Vol.II.1912-1927.p.264) මෙම ක්‍රියාවලිය අවසානයේ සංඝ සංශෝධනයට සහභාගි වූ භික්ෂූන් වහන්සේලා එක්වී සියලු ම සංඝයාගේ යහපැවැත්ම හා ආචාර ධර්ම සුරක්ෂිත කිරීම සඳහා ශාසනික කතිකාවතක්ද සම්පාදනය කළ අතර එය පොළොන්නරු ශාසනික කතිකාවත නමින් හඳුන්වයි. භික්ෂු සංඝයාගේ එකඟතාව මත බුද්ධ නීතිය හා පෙර සිරිත් විරිත් සම්ප්‍රදායන් උල්ලංඝනය නොකරමින් සම්පාදනය කළ කතිකාවත ගල්විහාර විහාර මන්දිරය

ඉදිරියේ ඇති ගල්තලාවේ කෙටුම්පත් කොට තිබේ. (E.Z.Vol. II.1912-1927. pp.265-268)

නිකාය සංග්‍රහයේද මේ කර්තව්‍යය එයාකාරයෙන් ම වාර්තා කර ඇති අතර එහිදී තුන්නිකා යන්නට වෙනස් වූ අදහසක් දී ඇති බවක් පෙනී යයි. ''ශාසනය භින්නකරනු සඳහා අන්‍යතීර්ථකයන් විසින් උපදවන ලදුව නින්දිතව පැවත එන වෛතුල්‍යවාදාදිවූ අධර්මය ධර්මයයි පවත්වාගෙන වසන පාපි මහණුන් නිසා යටකී වළගම් අභාමහරජහු පසළොස්වන්නෙහි පටන් තමන්ගේ සතරවන්නට එක්වාදහස් දෙසිය සිව්පනස් අවුරුද්දක් මුළුල්ලෙහි භින්නනිකායවැ ශාසනය පිරිහෙන පවත් අසා ...... නිර්මලව පවත්නා පරිද්දෙන් ශුද්ධ කෙරෙම් දෝහොයි සිතා එකල්හි ත්‍රිවිධ ශාසනයට ආධාරව සිටි අඛණ්ඩාච්ඡිද්‍රතාදි විවිධ ගුණොපලක්ෂිත ඖදුම්බරගිරි අරණ්‍යවාසි මහාකාශ්‍යප ස්ථවිරප්‍රමුඛ මහා විහාරවාසි මහාසඞගයාවහන්සේ කරා එළඹ එපවත් දන්වා, ඉක්බිති නිර්මල වූ සර්වඥශාසනය දුෂ්ප්‍රතිපත්තීන් කෙලෙසන ධර්මමරුචිය සාගලිකය වෛතුල්‍යවාදිය යන නිකායවාසිවූ නොයෙක් සියගණන් දුශ්ශීල පාපි භික්ෂූන් ගෙන්වා ලතාමණ්ඩපයෙක්හි සන්නිහිතකරවා තුන්යම් රාත්‍රියෙහි සිටිපියෙහි සිට ඔවුන් හැම දෙනම ශාසනාපගත කරවා බුද්ධශාසනය ශුද්ධකොට තුන්නිකාය සමඟ කරවා ......'' (නිකාය සංග්‍රහය, 1922, පිටු. 20,21) යනුවෙන් නිකාය සංග්‍රහයේ එන විස්තරයෙන්ද මහා පරාක්‍රමබාහු රජුගේ දායකත්වයෙන් සිදු වූ සංඝ සංශෝධනයත් නිකාය සාමග්‍රියත් පිළිබඳ විස්තර හඳුනාගත හැකි ය. මෙම කාර්යය පොළොන්නරුවේ ලතා මණ්ඩපයේදී සිදු වූ බවත් රජතුමා තුන්යම් රාත්‍රියේම නිදිවර්ජිතව සිටිමින් එයට සහභාගි වූ බවත් එහි සඳහන් ය. මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා සමගි වූ බැවින් ලතා මණ්ඩපයට කැඳවා ඇත්තේ ධර්මරුචි, සාගලික හා වෛතුල්‍යාවාදි නිකායන් නියෝජනය කළ භික්ෂු කණ්ඩායම් බව මෙහි එන සඳහනින් තහවුරු කරගත හැකි ය.

ඉහත සඳහන් කළ සියලු මූලාශ්‍රය විස්තර මහා පරාක්‍රමබාහු රජ අවධිය වන විට සසුන තුළ උද්ගතව

තිබූ තත්ත්වයත් එය යථා තත්ත්වයට ගෙන ඒම සඳහා රජතුමා කල්පනා කළ ආකාරයත්, ඒ සඳහා උදුම්බරගිරිවාසී මහා කාශ්‍යප හිමියන් හා අනෙකුත් භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කරගත් ආකාරයත්, සංඝ සංශෝධනය සිදු කරමින් තුන් නිකා සාමග්‍රිය සිදු කළ ආකාරයත් හඳුනාගත හැකි ය. මෙම ශාසනික ක්‍රියාදාමය මහා පරාක්‍රමබාහු රජු අතින් සිදු වූ වැදගත්ම ශාසනික ක්‍රියාදාමය ලෙසින් පෙන්වාදිය හැකි ය.

## මහා පරාක්‍රබාහු රජුගේ නව නිර්මාණ හා ප්‍රතිසංස්කරණය කළ ආගමික ගොඩනැගිලි

භික්ෂූන් වහන්සේලාගේ සැපවිහරණය පිළිබඳව සැලකිලිමත් වූ රජතුමා මහාවිහාරයක් ඉදිකිරීම සඳහා කැමැත්ත දක්වනුයේ ජේතවන නමින් මහාවිහාරයක්ද, එම ආශ්‍රමයේ වාසය කළ ස්ථිර සිල් ඇති ස්ථවිරයන්ට මාහැඟි වූ තුන්මහල් පහ අටක් ද, ශාරිපුත්‍ර නම් ස්ථිරශීලයෙන් යුක්ත වූ ස්ථවිරයන් වහන්සේට සඳලු සහිත උඩුමහල් ඇති ගබ්ගෙවලින් යුක්ත වූ බබලන්නා වූ මහාප්‍රාසාදයක්ද කරවූයේ ය. (මහාවංසය, ද්විතිය භාගය, 1996, පරි.78. ගාථා. 32-34) මීට අමතරව විවිධ ප්‍රතිමාවන්ගෙන් සමන්විත වූ තෙමහල් ප්‍රතිමා මන්දිර හැත්තෑවක් පමණ ද, හැත්තෑ පහක් පමණ වූ පිරිවෙන්ද, රම්‍ය ලක්ෂණ ඇති දෙමහල් දීර්ඝ ප්‍රාසාදයන් එපමණම ප්‍රමාණයක්ද, කරවූයේ ය. සුලුපහ එකසිය හැත්තෑ අටක්ද සූතිසක් (34) දොරකොටුද, පුස්තකාලය දෙකක්ද කුළුගෙවල් හා ගුහාවන්ද මල්කම් ලියකමින් යුත් දෙව් බඹ ආදින් පිළිරූ ඇති ශාලාවන් හා බොහෝ වූ ගබඩා ගෙවල්ද, ත්‍රිවංක ප්‍රතිමා ස්වාමීන්වහන්සේ සඳහා ත්‍රිවංක ප්‍රතිමා ගෘහයක්ද, සීහ, කිඳුරු හස් ආදි රූපවලින් බබළන්නා වූ නොයෙක් දැල්කවුළුවලින් හා බොහෝ පිළිකඩින්ද සිත්කළු වූ බිතු සිතුවම් ආදියෙන් සැදුම්ලත් සම්පූර්ණයෙන්ම ගලින් වට වූ දන්තධාතු මන්දිරයක්ද, ධර්මශාලා තුණක් හා එක් චෛත්‍යයක්ද දිගු සක්මන් මළු අටක්ද, දිගු පුළුල් වූ එක් බොජුන් හලක්ද, උළුසෙවිලි කරන ලද ගිනිහල් ගෙවල් අසූ පහක්ද, වැසිකිළි එකසිය හැත්තෑ අටක්ද කරවූයේ ය. (මහාවංසය, ද්විතිය භාගය, 1996, පරි.78. ගාථා. 35-45)

ඉහත සඳහන් කළ නිර්මාණයන්ට අමතරව භික්ෂූන් වහන්සේලාගේ පැන් පහසුවීම සඳහා වට නාන කොටුවය, ගුහා නාන කොටුවය, පියුම් නම් නාන කොටුවය, භද්‍ර නම් නාන කොටුවය ආදි වශයෙන් නාන කොටු අටක් ගලින්ම කරවා එහි ප්‍රාකාරද බැන්දවූයේ ය. (මහාවංසය, ද්විතිය භාගය, 1996, පරි. 78. ගාථා. 46-48) ඉහත සඳහන් කරන ලද සියලු නිර්මාණ රජතුමා විසින් ඉදිකරවන ලද ජේතවන විහාරයට අයත් වූ අතර ඒවා සියල්ල ගණනින් පන්සිය විස්සක් විය.

ජේතවන විහාරයට අමතරව රජු විසින් ඉදිකරන ලද නව ආරාම සංකීර්ණයක් වනුයේ ආදාහණ පිරිවෙන් සංකීර්ණයයි. එහි ස්ථවිරයන් වහන්සේලාට ඉතා සිත්කළු සඳලු තල සහිත තෙමහල් පහයක්ද කරවූයේ ය. දිගු පහ සතළිසක්ද, එපමණ වැසිකිළිද, සුලුපහ අටක්ද, දොරකොටු සයක්ද, ගිනිහල් ගෙවල් තිස් හතරක්ද, අතිශයින් මහත් වූ ප්‍රාසාද දෙකක්ද, සුබද්‍ර නම් චෛත්‍යයක්ද, රූපවතී නම් චෛත්‍යයක්ද, කරවූයේ ය. එහිම ඉතා මනහර වූ පිළිමවලින් සමන්විත ලංකාතිලක නම් පස්මහලින් යුත් ප්‍රතිමා මන්දිරයක්ද, සර්වඥයන් වහන්සේගේ ආයාමයෙන් යුක්ත වූ ලංකාතිලක නම් වූ සිටි පිළිමයක්ද කරවීය. මෙම නිර්මාණයන්ට අමතරව නොයෙක් කුළුගෙවල්වලින්ද, ගබ්හල් ගෙවලින්ද, මැදිරි ගෙවලින්ද යුක්ත වූ බද්ධ සීමා ප්‍රාසාද නම් වූ දොළොස්මහල් පොහොය ගෙයක්ද කරවීය. මහා පරාක්‍රමබාහු රජතුමා දේවානම් පියතිස්ස රජතුමා මහමෙවුනා උයන රන් නඟුලකින් සීමා බන්ධනය කළා සේ රන් නඟුලකින් සීමා බන්ධනය කොට නිමිති ගල්ද පිහිටුවූයේ ය. (මහාවංසය, ද්විතිය භාගය, 1996, පරි. 78. ගාථා. 49-62)

ඉහත සඳහන් කළ ආරාම සංකීර්ණයට අමතරව මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පශ්චිමාරාමය නමින් තවත් ආරාම සංකීර්ණයක් ඉදි කළේ ය. එහි විසි දෙකක් පමණ වූ පිරිවෙන්ද, එපමණක්ම වූ දෙමහල් දීර්ඝ ශාලාද, ගිනිහල් විස්සක්ද, දෙමහල් සුලුපහ විසි එකක්ද, වැසිකිළි තිස් පහක්ද, සක්මන් මළු දෙකක්ද එක් ධර්මශාලාවක්ද, දොරකොටු දහයක්ද කර වූ රජතුමා භික්ෂූන්

වහන්සේලාට එය පූජා කළේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 74-77)

මහා චෛත්‍යයට ආසන්න පර්වතය බිඳුවා එහි උත්තරාරාමය නමින් තවත් ආරාමයක ඉදිකරන ලදි. එහි සියලු කටයුතු සිදු කළ රජතුමා විද්‍යාධර ගුහාව නමින් ගුහාවක්ද, වැඩහුන් පිළිම ලෙනක්ද, හොත්පිළිම ගුහායෙක් යැයි ලෙන් තුනක් දක්‍ෂ ශිල්පීන් ලවා ඉදි කරවූයේ ය. මෙම සුවිශාල කර්මාන්තයට අමතරව පාණ්ඩ්‍ය දේශය තුළ සිදු කළ යුද්ධයේදී සිරභාරයට ගත් සිරකරුවන් මෙරටට ගෙනවිත් ඔවුන් ලවා කරවූ බැවින් දෙමළසෑය නම් ලත් එකදහස් තුන්සිය රියන් විශාල වූ සියලු ථූපයන්ට මහත්වූ දෙවැනි කෛලාසයක් සමාන වූ සෑයක්ද කරවීය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 78-82)

ඉහත සඳහන් කළ නව නිර්මාණයන්ට අමතරව රාජවෙසිභුජඟ නම් වූ ශාඛානරගයෙහි ඉසිපතන නමින් විහාරයක් කරවූයේ ය. එම විහාර සංකීර්ණය තුළ එක් දාගැබක්ද, තුන්මහල් පිළිමගෙයක්ද, පිළිම තුනක්ද, දෙමහල් පහයක්ද, දිගුපහ දෙකක්ද, දොරකොටු සතරක්ද, සුලුපහ අටක්ද, ධර්මශාලාවක් හා චඞකමණමාලකයක්ද, ගිනිහල් අටක්ද, වැසිකිළි සයක්ද ශෛලමය වූ නානකොටුවක්ද එක් සීමාපවුරු වළල්ලක්ද සංඝයා වහන්සේ වෙනුවෙන් පූජා කළේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 83-86) මීට අමතරව සිංහපුර නම් ශාඛානගරයෙහි කුසිනාරා නම් විහාරයක්ද කරවීය. එහිද දාගැබක්ද, තුන් මහල් ප්‍රතිමා මන්දිර තුනක්ද, දීර්ඝ ප්‍රාසාදයක්ද, ධර්මශාලාවක් හා සක්මන්මළුවක්ද, සුලුපහ දොළොසක්ද, දොරකොටු තුනක්ද, වැසිකිළි එකොළොසක්ද, ගිනිහල් සයක්ද කරවූයේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 87-89)

පරාක්‍රමබාහු රජතුමා විජිත නම් ශාඛාපුරයෙහි වේළුවන නමින් විහාරයක්ද කරවූයේ ය. එහි මනහර වූ පිළිම හා සිතුවමින් බබළන තුන්මහල් පිළිම ගෙවල් තුනක්ද, දාගැබක්ද, සක්මන්

මළුවක්ද, දෙමහල් පහයක්ද, දොරකොටු හතරක්ද, දිගුපහ තුනක්ද, සුලුපහ අටක්ද, එක් බොජුන් හලක්ද, එක් ධර්මශාලාවක්ද, ගිනිහල් හතරක්ද, වැසිකිළි දොළසක්ද කරවූයේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 90-94) මීට අමතරව එතුමා විසින් ගව්වක් ගව්වක් තන්හී මනහර වූ ප්‍රතිමා මන්දිරයන් හා දොරකොටු පවුරු දම්හලින් යුත් ගාවුතවිහාරයන්ද කරවූයේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 94-95)

මෙම නිර්මාණයන්ට අමතරව ධූතාංගධාරී භික්ෂූන්වහන්සේලාගේ සැපවිහරණය පිණිස කපිල නම් විහාරයක්ද කරවූයේ ය. එහි මහාර්ග වූ දෙමහල් පහ සතරක්ද, ගිජුලිහිණියෙකු බඳු ගෙයක්ද, සුලුපහ සතරක්ද, වැසිකිළි තුනක්ද කරවා භික්ෂූන්ට දුන්නේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 78. ගාථා. 95-99) මේ ආදි වශයෙන් මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු අගනගරයේ මෙන්ම අගනගරයට ඉතා ආසන්නයේ වූ ශාඛා නගර ද කේන්ද්‍ර කරගනිමින් විවිධ භික්ෂු කණ්ඩායම් වෙනුවෙන් වෙහෙර විහාර, පිරිවෙන් සංකීර්ණ, ප්‍රතිමා ගෙවල්, දෙමහල්, තෙමහල්, පස්මහල් ආවාස ගෙවල්, වැසිකිළි හා කැසිකිළි ආදි වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ සුඛවිහරණය සඳහා අවශ්‍ය කරන නිර්මාණ රැසක් අලුතින් ම ඉදිකරන්නට වූ බව වංසකථාවේ සඳහන්ව ඇත. මෙම නිර්මාණ අතර සුවිශාල දැගැබ් හා ප්‍රතිමා මන්දිර කිහිපයක් ම වූ බව වංසකථාව් එන විස්තරවලින් තහවුරු කරගත හැකි ය.

අනුරාධපුර රාජධානියට අයත් විශේෂයෙන් ම තත් නගරයට කේන්ද්‍රගතව තිබුණු පැරණි පූජනීය ස්ථාන සියල්ලම පාහේ මහා පරාක්‍රමබාහු රජු අතින් ප්‍රතිසංස්කරණයට ලක් වූ බව පෙනේ. ද්‍රවිඩ ආක්‍රමණ නිසා විනාශ වූ ද පෙර රජවරුන්ට ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වූ ද විහාර කරවීම පිණිස රජු විසින් එක් ඇමැතිවරයෙක් යෙදවූයේ ය. එවකට එක්විසි රියන් උස්වූ රුවන්වැලි සෑයද, එක්සිය සතළිස් රියන් උස්වූ අභයගිරි සෑයද, එක්සිය සැටරියන් උස්වූ ජේතවන සෑයද, අසූරියන් උස්වූ මිරිසවැටි සෑයද යන මේ පූජනීය ස්ථාන යාමට අපහසු

වූ ද මහ ඝන කැලෑවන්ගෙන් මෙන්ම වන සතුන්ගෙන්ද ගැවසීගත් බැවින් ඒවා ශුද්ධ කරවා දාගැබ්හි ප්‍රතිසංස්කරණ කටයුතු කොට ප්‍රධාන සෑ තුනම සුණුකම් කළ බව වංසකථාවේ සඳහන් වේ. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 78. ගාථා. 100-105) මීට අමතරව එක් එක් පසෙකින් සියක් රියන් වූ සියක් රියන් විශාලවූ උසින් එපමණ වූ සොළීන් නසන ලද්දා වූ ලෝවාමහපාය එක්දහස් සසියයක් ගල්ටැම් පිහිටුවා නොයෙක් සිය ගණන් ගබ්ගෙවලින් හා උතුම් කුළුගෙවල්වලින්ද සිව්මැදුරුවලින්ද අලංකාර කරන ලදි. සැටක් මහපා ඇති මහා ප්‍රාසාදයද විනාශ වූ මහෙන්ද්‍ර සේන නම් ප්‍රසාදයද බොහෝ වූ සීමා ප්‍රාකාරයන්ද පිරිවෙන්ද කරවූයේ ය. දන්හලක්ද කරවා දන්වැට තැබ්බවීය. ථූපාරාම වැනි පැරණි පිරිවෙන්හී කැඩුණු බිඳුණු තැන් ද ප්‍රතිසංස්කරණය කරවූයේ ය. එසේම එතුමා සෑගිරියෙහි හැට හතරක් පමණ වූ දාගැබ්ද කරවීය. පැරණි වාසස්ථානවල සුන්බුන් තැන්ද පිළිසකර කරවූයේ ය. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 78. ගාථා. 105-111)

ඉහත සඳහන් කරන්නට යෙදුණු නව නිර්මාණ හා ප්‍රතිංස්කරණයන්ට අමතරව එතුමා විසින් ග්‍රීෂ්ම කාලයෙහි භික්ෂූන්ට ස්නානය කිරීම සඳහා නන්දන උයනේ ගල් පොකුණු දෙකක් කරවූයේ ය. රජරට නොයෙක් ගම්නියම්ගම්වල අභිනවයෙන් ස්ථූප අනූ නවයක් ඉදි කරවූයේ ය. හැත්තෑ තුනක් පමණ වූ ධාතු ගර්භයන්හී සුන්බුන් පිළිසකර කරවා සුණුවම් කරවීය. හයදාස් එක්සියයක් පමණ වූ ප්‍රතිමා මන්දිරයන්ද ප්‍රතිසංස්කරණ කළේ ය. ජීර්ණ වූ ප්‍රතිමා මන්දිර තුන්සියයක් අභිනව කොට කරවූයේ ය. සාරසිය සත්තෑ හයක් නානාප්‍රකාර ප්‍රතිමාවන්ද කරවූයේ ය. බෝධි වෘක්ෂ අනූ එකක්ද රෝපණය කරවූයේ ය. සිවු දිශාවෙන් වැඩම කරන සංඝයාගේ පහසුව සඳහා දෙසීය තිහයක් පමණ වූ ආවාස කරවූයේ ය. ධර්මශාලා පණස් හයක්ද, සක්මන් මළු නවයක්ද කරවූයේ ය. එකසිය හතළිස් හතරක් අධික කොට ඇති දොරකොටුද, එකසිය අනූ දෙකක් පමණ වූ මලසුන් ගෙවල්ද කරවූයේ ය. ධර්මශාලා විසි නවයක් ප්‍රකෘතිමත් කළේ ය. ලෙන් තිස් එකක්ද, ආරාම පහක්ද, පණස් එකක් වූ ආගන්තුක ශාලාවන්ද අභිනවයෙන් කරවූයේ ය. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 79. ගාථා. 5, 14-23)

මහා පරාක්‍රමබාහු රජු මෙම ආගමික කාර්යයන්ට අමතරව යුව රජුගේ රාජ්‍යයෙහිද නොයෙක් ආකාරයේ ආගමික ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කළේ ය. සිය උත්පත්තිය සිදු වූ පිළගම එකසිය විසිරියනක් උසින් සූතිඝර නමින් චෛත්‍යයක්ද කරවීය. දාගැබ් විසි දෙකක්ද, බෝධි වෘක්ෂයන් තිස් තුනක්ද, ප්‍රතිමා මන්දිර සියයක්ද, ලෙන් පසළොසක්ද, සංඝයා වහන්සේ වෙනුවෙන් ආවාස ගෙවල් විසි එකක්ද, අසූ හතක් වූ ආගන්තුක ශාලාද, මල් ආසන ගෙවල් විසි නවයක්ද, ධර්ම ශාලා හතක්ද, පවුරු පහක්ද, නොයෙක් ප්‍රතිමා හතළිස් තුනක්ද කරවූයේ ය. ජීර්ණ වූ ප්‍රතිමා මන්දිර විසි හතරක්ද ප්‍රතිසංස්කරණය කළේ ය. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 79. ගාථා. 61-66)

දක්ෂිණ දේශයේ සිදු කළ මෙම ආගමික කාර්යයන්ට අමතරව රුහුණු රටද ආගමික කාර්යයන් කිහිපයක්ම සිදු කළ බව වංසකථාවේ සඳහන්ව ඇත. ඒ අනුව කිරිගම තමන්ගේ මෑණියන්ගේ ආදාහණ ස්ථානයෙහි එකසිය විසිරියන් පමණ වූ රත්නාවලී නමින් සෑයක්ද, දාගැප් සොළසක්ද, බෝධි වෘක්ෂ හතක්ද, එපමණ වූ බෝගෙවල් හා බෝ කොටුද, දෙමහල් පිළිම ගෙවල් හතළිස් තුනක්ද, ධර්මශාලා දෙකක් හා ප්‍රතිමා හැත්තෑ පහක්ද, සතරදිගින් වැඩම කරන සංඝයා වහන්සේලා උදෙසා ආවාස තිස්හතක්ද, හතළිස් හතක් ප්‍රාකාරයන්ද, දොරකොටු විස්සක්ද, පණස් නමයක් වූ ආගන්තුක ශාලාද, ආරාම සතරක් හා මෛත්‍රෙ (බෝසත්) රූ තුනක්ද කරවමින් ඒ ඒ තන්හි තිබූ සුන්බුන්ද ප්‍රතිසංස්කරණය කළේ ය. (මහාවංසය, ඕතිය භාගය, 1996, පරි. 79. ගාථා. 71-77) මීට අමතරව ථූපයන් තිස්හතරක්ද, බෝකොටු විසි දෙකක්ද, මහ පිළිම ගෙවල් දෙසීය සැත්තෑ හතරක්ද, එක් දාගෙයක්ද, හොත්පිළිම ගෙවල් සතක්ද, ලෙන් හතළියහක්ද, ගඩොලින් කළ මන්දිර සතරක්ද, දීර්ඝ ප්‍රාසාද හතරක්ද, තෙමහල් ප්‍රාසාද සයක්ද, ධර්මශාලා විසි නවයක්ද, සක්මන් මළු තුනක්ද, වාසමන්දිර එකසිය විසි හයක්ද, පුස්තකාල එකසිය විසි අටක්ද, ආගන්තුක ශාලා සතරක්ද, දේවමන්දිර විසිහතරක්ද, ගෝපුරද්වාරයන් එකසිය තුනක්ද, ප්‍රාකාර එකසිය විසිහයක්ද මහා පරාක්‍රමබාහු රජතුමා පිළිසකර කරවූයේ ය. එසේම

උරුවෙල් මහවැවද, පඬුවැවද, කොළොම්වැවද ආදි කොට ඇති දෙසිය දහසයක් වූ සඟසතු වැව්ද බැඳවූයේ ය. (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 79. ගාථා. 78-85)

වංසකථාවේ සඳහන්ව ඇති ඉහත විස්තරයන්ට අනුව මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරු අගනුවර හා ඊට ආසන්න ශාඛා නගරයන්හිද, පැරණි රාජධානිය වූ අනුරාධපුර නගරය හා ඒ ආශ්‍රිත ස්ථානවලද, දක්ෂිණ දේශයේ මෙන්ම රුහුණු රටද ආදි වශයෙන් සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන ආකාරයෙන් බුදුසසුනේ චිරස්ථිතිය සඳහා මහා දෑගැබ්, ප්‍රතිමා ගෘහ, විවිධ මාදිලියේ බුද්ධ ප්‍රතිමා, බෝධි වෘක්ෂ රෝපණයන්, ආවාස ගෙවල්, පිරිවෙන්, ධර්මශාලා, කැසිකිළි හා වැසිකිළි, සක්මන් මළු ආදි වශයෙන් බෞද්ධාගමික සම්ප්‍රදායේ භෞතික සම්පත් වර්ධනය කිරීම සඳහා නව නිර්මාණ රැසක් ඉදිකිරීමටත් පැරණි අවධීන්හි දක්නට ලැබුණු ජරාජීර්ණව පැවති දාගැබ්, ප්‍රතිමා හා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමටත් කටයුතු කළේ ය. බුදුසසුනේ චිරස්ථිතිය සඳහා ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසය තුළ වැඩිම දායකත්වයක් සැපයූ පාලකයා ලෙසින් මහා පරාක්‍රමබාහු රජතුමා නම් කළ හැකි ය. වසර තිස් තුනක් පමණ වූ ඔහුගේ පාලන අවධිය තුළ ඔහු විසින් බුදුසසුන වෙනුවෙන් කරන ලද නිර්මාණ සැබවින්ම විශ්මය ජනක ය. මෙම ආගමික ගොඩනැගිලි නිර්මාණය කරමින් ඔහු භෞතික සම්පත් වර්ධනය කිරීම සඳහා කටයුතු කළා සේම ඔහුගේ දායකත්වයෙන් සිදු වූ සංඝ සංශෝධනයත්, නිකාය සාමග්‍රියත්, පොළොන්නරු ශාසනික කතිකාවතත් අන් සියලු දේව වඩා වැදගත්කමින් අනූන වනුයේ සංඝ සමාජයේ අභ්‍යන්තර ශෝධනය එයින් ඇතිකිරීමට සමත් වූ බැවිනි.

## නිශ්ශංකමල්ල රජුගේ ශාසනික කාර්යභාරය

මහා පරාක්‍රමබාහු රජුට පසුව බුදුසසුනේ චිරස්ථිතය සඳහා කටයුතු කළ පොළොන්නරුවේ රාජත්වයට පැමිණි පාලකයන් අතුරින් ඉදිරියෙන් සිටින පාලකයෙකු වන්නේ නිශ්ශංකමල්ල

රජතුමා ය. ඔහුගේ ශාසනික කර්තව්‍යයන් වාර්තා කරන මහාවංසය, ඔහු විසින් පොළොන්නරුවේ ඉතා රම්‍ය වූ ශෛලමය දළදා මන්දිරයක්ද, ඉතා උස්වූ රත්නාවලී නම් චෛත්‍යයක්ද, සිය නමින් වෙහෙරක්ද කරවා භික්ෂු සංඝයාට පරිත්‍යාග කොට උපස්ථාන කරන ලදැයි වාර්තා කොට තිබේ. (මහාවංසය, ඩිතිය භාගය, 1996, පරි. 80. ගාථා. 20-21) ඔහු විසින් කරන ලද ශෛලමය වටදාගෙය හෙවත් දළදා මන්දිරය පිළිබඳ සඳහනක් ඔහුගේ හැටදාගේ ඉදිරිපස ඇති ශිලාලේඛනයේද අන්තර්ගත කර තිබේ. (E.Z.Vol.II.1912-1927. p.87) මීට අමතරව රන් රිදියෙන් උසස්ව බබළන්නා වූ බිතුසිතුවම්වලින් අලංකාර කොට, රනින් කරන ලද උළු සෙවිලි කරමින් දඹකොල නමින් වෙහෙරක්ද කරවා එහි ස්වර්ණමය වූ බුද්ධ ප්‍රතිමා සැත්තෑ තුනක් පිහිටුවූයේ ය. (මහාවංසය, ඩිතිය භාගය, 1996, පරි. 80. ගාථා. 22-24) මෙම ආගමික කාර්යයන්ට අමතරව එතුමා සිය චතුරංගිනී සේනාව පිරිවරාගෙන සමන්තකූට පර්වතයට ගොස් වන්දනා කළ බව වංසකථාවේ සඳහන් වන අතර පාලකයෙකු සිරිපා වන්දනාවේ ගියේ යැයි සඳහන් වන පළමු අවස්ථාව ලෙස මෙය හඳුනාගත හැකි ය. (මහාවංසය, ඩිතිය භාගය, 1996, පරි. 80. ගාථා. 24-25)

ඉහත සඳහන් ශාසනික කාර්යයන්ට අමතරව එතුමා විසින් අනුරාධපුර නගරයේ වූ ආගමික ස්ථාන, දෙවිනුවර, කැලණිය හා මහියංගණ ආදි ස්ථානවල වෙහෙරද, දඹුලු ලෙනෙහි ''හුන් සිටි පිළිමද ..... සත රන්මය කරවා (ස)ත් ලක්ෂයක් ධන වියදම් කොට මහ පුද කරවා සුවර්ණගිරිගුහා යැයි නම් තබා කරවා වදාළ ශිලාලේඛයය'' (E.Z.Vol.I.1904-1912.p.130) දඹුලු විහාර කර්මාන්තය, දෙව්වනුවර, කැළණි යන විහාර ප්‍රතිසංස්කරණයන්ට අමතරව මැඩිලිගිරි, වෙල්ගම්වෙහෙර යන ස්ථානවලටද ගොස් ඒවා ප්‍රතිසංස්කරණය කරමින් විශාල පරිත්‍යාගයන් සිදු කළ බව නිශ්ශංකමල්ල රජුගේ ප්‍රීති දානක මණ්ඩප ශිලාලේඛනයේද සඳහන්ව ඇත. (E.Z.Vol.II.1912-1927.p.170) මෙම ස්ථාන කරවා යන්නෙන් සඳහන් කර තිබුණද එයින් කියැවෙන්නේ මෙම ස්ථාන ප්‍රතිසංස්කරණ කළ බව විය හැකි ය.

වංසකථාවේ සඳහන් නොවූවද නිශ්ශංකමල්ල රජු විසින්ද ශාසන ශෝධනයක් සිදුකරමින් සසුන පිරිසිදු කළ බව ඔහු විසින් පිහිටුවා ඇති ශිලාලේඛන කිහිපයකදීම සඳහන් කර තිබේ. ඔහු විසින් පිහිටුවා ඇති ගල්පොත ශිලාලේඛනයේ ''බුදුසස්නෙහිද නයවිනය වූ පරිද්දෙන් දුශශීල කණ්‍ටක පහකොටැ ලොක ශාසන නිෂකණ්‍ටකකොටැ සුශීල මහසඟනට සිවුපසයෙන් උපසථානකොටැ හවුරුදු පතා මහණුවම් කරවා කඨිනදාන දී ......'' (E.Z.Vol.II.1912-1927, p.106) යනුවෙන්ද, ''.....(පින්පුරා) බොහෝ කල් භින්නව තුබූ තුන් නකාහි සඟුරුවන් සමඟ කරවා තෙවළා බුදු වදන බජන කරවා'' යනුවෙන් දඹුලු විහාර පර්වත ලිපියේද සඳහන් කොට ඇත. (E.Z.Vol.I.1904-1912.p.130) ඔහු විසින් පිහිටුවා ඇති වාඳුරුප්ප ශිලාලේඛනයේද ''තුන් නිකා සමගි කොටයි'' යනුවෙන් එය සඳහන් කොට ඇත. නිශ්ශංකමල්ල රජු විසින් සිදු කළා යැයි සඳහන් වන තුන් නිකා සාමග්‍රිය සැක සහිත කරුණකි. ඔහු විසින් සැබවින්ම එවැනි කාර්යයක් කළේ නම් මහා පරාක්‍රමබාහු රජ දවස එවැනි නිකා සාමග්‍රියක් සිදු වූයේද යන්න අප ඉදිරියේ ඇති ප්‍රශ්නය යි. මහා පරාක්‍රමබාහු රජ දවස එවැනි නිකා සාමග්‍රිය සිදු වූයේ යැයි පිළිගන්නේ නම් ඔහුට වසරකට පසුව රාජත්වයට පත් වූ නිශ්ශංකමල්ල රජු විසින්ද එවැනිම ආකාරයේ නිකා සාමග්‍රියක් සිදු කළා යැයි කීම විමසිය යුතු කරුණකි. වසරක් ඇතුළත සසුන පැරණි තත්ත්වයට ම පත්ව තිබුණේ යැයි පිළිගැනීම උගහට වන බැවින් නිශ්ශංකමල්ල රජුගේ නිකා සාමග්‍රිය ප්‍රශ්නකාරි වූවක් ලෙස සැලකිය හැකි ය. වසර නවයක් වැනි කෙටි කාලයක් රාජත්වය හෙබවූයේ නමුත් ඔහු ද ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් විශාල වැඩකොටසක් සිදු කර ඇති බව වංසකථාවේ හා ඔහුගේ ශිලා ලේඛනවල එන විස්තරවලින් තහවුරු කරගත හැකි ය.

## නිශ්ශංකමල්ල රජතුමාට පසු අවධියේ සිටි පාලකයන් අතින් සිදු වූ ශාසනික දායාදයන්

පශ්චාත් නිශ්ශංකමල්ල රජ අවධියේ ව්‍යාකූල දේශපාලන වාතාවරණයක් සහිත කාලපරිච්ඡේදයක් වූ බැවින් සිංහාසනප්‍රාප්ත

පාලකයන් අතින් ශාසනයේ අභිවෘද්ධිය සඳහා කැපී පෙනෙන ආකාරයේ වැඩකොටසක් සිදු වූ බවක් දක්නට ලැබෙන්නේ නැත. ඔවුන් වැඩි වශයෙන් අවධානය යොමු කොට සිටියේ තම සිංහාසනය ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙළ වෙනුවෙන් ය. නමුත් නිශ්ශංකමල්ලගේ අභාවයේ සිට කාලිංග මාඝ නම් ආක්‍රමණිකයාට පොළොන්නරු රාජධානිය යටත් වන තෙක් එහි සිටි පාලකයන් කිහිප දෙනා අතුරින් අතළොස්සක් වූ දෙනාගෙන් බුදුසසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් කිසියම් කාර්යභාරයක් සිදු වූ බව මූලාශ්‍රය විස්තරයන්ගෙන් පැහැදිලි කරගත හැකි ය.

''බුද්ධ ශාසනයෙහි මමත්වය ඇත්තා වූ ඒ කල්‍යාණවතී නම් දේවි තොමෝ පර්ණහාලක නම් ගමෙහි සිය නමින් වෙහෙරක් කරවා ඊට ගම් නතුකිරීමෙන් ගම් කෙත් පිරිකර මෙහෙකරුවන් හා උයන් ආදියද දුන්නී ය. ඒ බිසව අනුමැතියෙන් ..... ආයශ්මන්ත නම් සේනාපතිතෙම දෙව නම් අධිකාරීන් වල්ලි නම් ගම් යවා එහි මනොහරවූ විහාරයක් කරවා මහසඟට දෙවී. හෙතෙමේ ස්වකීය රාජකුලය පිළිබඳවූ වර්ධන ඇති සිය නමින් ප්‍රසිද්ධ වූ පිරිවෙණද කරවා ..... ගම් කෙත් පිරිකර හා දාසි දාසයන් දුන්නේ ය.'' (මහාවංසය, ඞිතිය භාගය, 1996, පරි. 80. ගාථා. 35-41) ආයශ්මන්ත සෙනෙවියාගේ සහයෙන් රාජත්වයට පත් නිශ්ශංකමල්ල රජුගේ අගබිසව වූ කල්‍යාණවතී බිසව හා ඇයගේ සමීපතමයන් විසින් බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් කරන ලද නව නිර්මාණ හා පරිත්‍යාගයන් කවරේද යන්න වංසකථාව වාර්තාකර ඇත්තේ මෙයාකාරයෙනි. මීට අමතරව ලක්විජය සිඟු සෙනෙවි විසින් කරවන ලද විහාරය ජීර්ණව අනාවාසව පැවැති බැවින් එහි පිළිම ගෙය කරවා දාගැබ බන්දවා එහිම ජීර්ණව පැවති සංඝාරාමයද පැන්සැල් සහිත කොට කරවා මහසංඝයාට දුන් බව බතලගොඩවැව ශිලා ලේඛනයේ සඳහන්ව ඇත. (E.Z.Vol. IV.1933-1934. p.78)

මේ ආදි වශයෙන් පොළොන්නරු රාජධානියේ රාජත්වයට පත් මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යන රජවරු හා කල්‍යාණවතී යන රැජින බුදුසසුනේ චිරස්ථිතිය

සඳහා සංඝ සමාජයේ අභ්‍යන්තරය පිරිසිදු කරමින් කතිකාවත් සම්පාදනය කිරීමට හා උපසපම්දා විනය කර්මයන් කිරීමට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම්, නිකා සාමග්‍රිය වැනි කාර්යයන් සිදුකරමින් සංඝ සමාජයේ සාමූහිකත්වය ආරක්‍ෂා කිරීම, දාගැබ්, බෝ, බුද්ධ ප්‍රතිමා, පිරිවෙන්, ආවාස ගෙවල්, කැසිකිළි හා වැසිකිළි ආදි වශයෙන් භික්‍ෂූන් වහන්සේගේ පරිභෝජනයට අවශ්‍ය කරන භෞතික සම්පත් වර්ධනය කිරීම්, විවිධ හේතු නිසා ජරාජීර්ණව පැවති ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම් වැනි කාර්යයන් රැසක් කරන්නට යෙදුණු බව වංසකථා සාහිත්‍යය හා ශිලාලේඛන මූලාශ්‍රය තුළින් කරුණු අනාවරණය කරගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*ඌනපූරණසහිතො මහාවංසො*, (1959), (සංස්.), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, කොළඹ: ඇම්. ඩී. ගුණසේනනාමාය සීමිත සමිතියා.

*නිකාය සංග්‍රහය*, (1922), (සංස්.), ද සිල්වා, සයිමන් ඇතුළු පිරිස, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*මහාවංස*, ඞිතිය භාගය, (1996), (සංස්.), සුමඟල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, දෝන් අන්ද්‍රිස් ද සිල්වා, ගංගොඩවිල: සීමාසහිත 'දීපානි' මුද්‍රණරුප්‍රකාශන (පෞද්ගලික) ආයතනය.

*Epigraphia Zeylanica, Vol. I*, (1904 – 1912), (ed.), Wickremasinghe, D.M.D. Zilva, New Delhi: Asian Educational Services.

*Epigraphia Zeylanica,Vol. II*, (1912-1927), (ed.), Wickramasingha, D.M.D.Z., London: Oxford University press.

*Epigraphia Zeylanica, Vol. IV*, (1933-1934), (ed.), Codrington,H.W., and Paranavitana, S., London: Oxford Univesity Press.

### ද්විතීයික මූලාශ්‍රය

*ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම II*, (2012), (සංස්.), විජේතුංග, ඩබ්ලිව්. එම්. කේ., කොළඹ: සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම.